**2022 ජුනි මස 20 වන දින පැවති කාන්තා හා ළමා කටයුතු, සමාජ සවිබල ගැන්වීම,ජීවනෝපාය සංවර්ධන හා දරිද්‍රතාවය පිටු දැකීමේ ස්ථාවර කමිටුව**

කමිටු සාමාජිකයන්

01. ඩබ්.එම්.සුපිනි සඳමාලි මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
02. එච්.බී.සීතා හේරත් මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
03. කේ.පී.සචිනි නිමේෂා මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
04. නීතිඥ නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
05. කේ.ඒ.ඉන්ද්‍රාණි මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

නොපැමිණීම

01. එච්.බී.සීතා හේරත් මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
02. කේ.පී.සචිනි නිමේෂා මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

නිලධාරි

01. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
02. වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩී.රත්නායක මහතා - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
03. එන්.පී.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
04. ජී.වී.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක
05. එම්.යු.එම්.සුගත් ප්‍රියන්ත මහතා - සංවර්ධන නිලධාරි (සැළසුම්)
06. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

නිලධාරි නොපැමිණීම

01. වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩී.රත්නායක මහතා - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි

1. නව ශිෂ්‍යාධාර, පුණ්‍යාධාර හා රෝගාධාර ලබාදීම අත්හිටුවීම 2022 මැයි මස මුදල් ස්ථාවර කමිටුවේ ගනු ලැබූ තීරණය මහා සභාවේදි අනුමත වි ඇත. එම නිසා මෙම ඉල්ලීම් නැවත සාකච්ජා කිරිම සඳහා ජුලි මස කමිටුව වෙත යොමු කිරිමට තීරණය කරන ලදි.

| අනු අංකය | කොට්ඨාශ මන්ත්‍රී | ඉල්ලුම්කරු | ඉල්ලීම |
|---|---|---|---|
| ශිෂ්‍යාධාර | | | |
| 1 | ආර්.ඒ.ඩබ්.රවින්ද්‍ර රණසිංහ මැතිතුමා | කේ.එච්.සවිත් රශ්මික, අංක:991/බි/33/1, 2 වන පියවර,අනුරාධපුර. | කේ.එච්.සවිත් රශ්මික දරුවාහට ශිෂ්‍යාධාර මුදල ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම. |
| 2 | දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමා | පී.ඩී.නිලංකා චාමලී, අංක:619/36 ඒ, 2 වන පියවර, අනුරාධපුර. | එම්.ජී.ඩිනුල අනුහස් සමරසිංහ සහ එම්.ඩී.ඔෂධ සෙහස් සන්දිලු සමරසිංහ යන දරුවන් දෙදෙනාහට 2022 වර්ෂයේ අප්‍රේල් මස සිට ශිෂ්‍යාධාර මුදල අනුමතව් ඇති බැවින් ජනවාරි,පෙබරවාරි සහ මාර්තු යන මස තුනේම ශිෂ්‍යාධාර මුදල ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම. |

2. කමිටු සභාපති විසින් 2022 වර්ෂයේ කාන්තා දින නිමිති කර ගෙන පවත්වන ලද වැඩසටහනේ සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
කාන්තා දින වැඩහනනේ වැඩසටහන් විස්තර බෙදා දෙන ලද භාණ්ඩ විස්තර හා ඉතිරි භාණ්ඩ විස්තර පිළිබඳ වාර්තාවක් 2022.06.23 වන දිනට ප්‍රථම ලබා ගැනිමට තීරණය විය. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

3. කමිටු සභාපති විසින් 2022 වර්ෂයේ පාසල් පොත් බෙදාදිම සම්බන්ධව වාර්තාවක් ලබා දෙන ලෙස කල ඉල්ලීම. කොට්ඨාශ අනුව පාසල් පොත් ගත් මුළු සංඛ්‍යාව, බෙදාදුන් සංඛ්‍යාව හා ඉතිරි පොත් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු වාර්තාවක් 2022.06.23 වන දිනට ප්‍රථම ලබා ගැනිමට තීරණය විය. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

<u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>

1. නාගරික මන්ත්‍රී කේ.ඒ.ඉන්ද්‍රාණි මුණසිංහ මැතිතුමිය ලිපියක් ඉදිරිපත් කරමින් 2022 වර්ෂයේ අයවැය මගින් වෙන් කරන ලද මුදලට පහත සඳහන් යෝජනා ඉදිරිපත් කිරිම.
    1. 318 සාලිය මාවත අක්ෂි සායනයක් පවත්වා ඇස් කණ්ණාඩි ලබාදීම.
    2. දිග අඩි 20 පළල අඩි 15 ප්‍රමාණයේ අව්වැසි ආවරණයක් (රෙදි ආවරණයක්) ලබාදීම.
    3. ඉතිරි මුදලින් පෝෂණ මල්ලක් බැගින් ගැබිනි මව්වරුන් හා වයස අවුරුදු 05 ට අඩු දරුවන් සිටින මව්වරුන් සඳහා ලබාදීම.

2. නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 255 කොට්ඨාශය සඳහා පහත සඳහන් යෝජනා ඉටු කර ගැනිමට කොට්ඨාශයට රුපියල් ලක්ෂ 12 ක ප්‍රතිපාද වෙන් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම අනුමැතියට යොමු තිරිම.
    1. අක්ෂි සායනක් හා ඇස් කණ්ණාඩි ලබාදිම.
    2. අඩි 20 දිග පළල අඩි 15 න ප්‍රමාණයේ තහඩු හට් 02 ක්

3. අනුරාධපුර,තම්මැන්නාකුලම,ජය මාවත පදිංචි ඩී.එස්.හිරුනි ඉමල්ෂා කරුණාරත්න මිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් රූපලාවන්‍යාගාර උපකරණ ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීමට අදාල ක්ෂේත්‍ර පරික්ෂන වාර්තාව අනුව අදාල ගොඩනැගිල්ල ඉදිකර අවසන් වූ පසු wash basin - 01 හා chair – 01 ලබාදීම සඳහා අනුමැතියට යොමු කිරිමට තීරණය විය.

4. නාගරික මන්ත්‍රී සුරංගී ආර් සමරතුංග මැතිතුමිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 2022 වර්ෂයේ අයවැයෙන් 248 කොට්ඨාශයට වෙන් වූ සුබ සාධන සේවාවන් සඳහා පහත සඳහන් යෝජනා ඉටුකර දීමට අනුමැතියට යොමු කිරිම.

- කොට්ඨාශයේ ගර්භනි මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 10 ට අඩු දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහල දැමිම සඳහා පෝෂ්‍යදායි ආහාර මල්ලක් ලබාදීම - ලක්ෂ 05

5. නාගරික මන්ත්‍රී විරාජ් රණවිර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් ලෝක කාන්තා දිනය වෙනුවෙන් වැඩසටහන් සිදු කිරිමට වෙන් කරන ලද රු.100,000.00 ක ප්‍රතිපාදන අංක 03 හේනවත්ත කොට්ඨාශයේ ආයුර්වේද වෛද්‍ය සායනයක් පැවැත්විමට වෙන් කර දෙන ලෙසත්, එම ප්‍රතිපාදන අදාල කාර්යය මෙහෙය වනු ලබන 571 නුවර වැව වෙහෙර මහා දෙවි ප්‍රජා මණ්ඩලයයේ ගිණුමට බැර කරන ලෙසත් කර ඇති ඉල්ලිම අනුමැතියට යොමු කිරිම.

ඩබ්.එම්.සුපිනි සඳමාලි,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

කාන්තා හා ළමා කටයුතු, සමාජ සවිබල ගැන්විම,ජිවනෝපාය සංවර්ධන

හා දරිද්‍රතාවය පිටුදැකිම පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.